විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් මැද පෙරදිග පවතින තත්ත්වයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා හදිසි ප්‍රතිචාර ඒකකයක් ස්ථාපිත කරයි.**

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් මැද පෙරදිග පවතින ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් උද්ගතවන තත්ත්ව පිළිබඳ කරුණු සම්බන්ධීකරණය කිරීම සඳහා **හදිසි ප්‍රතිචාර ඒකකයක්** පිහිටුවා ඇත.

1. මෙම **හදිසි ප්‍රතිචාර ඒකකය** පහත අරමුණු මත පිහිටුවා ඇත.

- **ශ්‍රී ලාංකික ජාතිකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය දීම**: ශ්‍රී ලාංකිකයින් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් මැදපෙරදිග කලාපයේ ජීවත් වන බැවින් සහ සේවය කරන බැවින්, ඔවුන්ගේ ආරක්ෂාව රජය සිය ප්‍රමුඛතාව ලෙස සලකයි.

- **ශ්‍රී ලංකාවේ සිටින ශ්‍රී ලාංකික නොවන ජාතිකයින්ට සහය වීම:** වත්මන් තත්ත්වය හේතුවෙන් විදේශීය ජාතිකයන් මුහුණ දෙන ගැටලු, එක් එක් ගැටලුව මත පදනම්ව විසඳනු ලැබේ.

**2. ක්‍රියාත්මක වන වේලාවන්**

හදිසි ප්‍රතිචාර ඒකකය දිනපතා පැය 24 × 7 පදනම මත ක්‍රියාත්මක වේ

**3. සම්බන්ධ කරගන්නා ආකාර**

පහත සඳහන් සම්බන්ධීකරණ අංක හරහා, පවුල්වලට සහ පුද්ගලයන්ට මෙම අංශය හා සම්බන්ධ විය හැකිය:

- **හදිසි ප්‍රතිචාර ඒකකය, විදේශ කටයුතු අමාත්‍යාංශය** :**+94117445641**
  :**+94112207250**
  **WhatsApp /Botim හරහා පමණි** :**+94777390031**
  **විද්‍යුත් තැපැල** :**emergency.sl@mfa.gov.lk**
- **කොන්සියුලර් කටයුතු අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය** :**+94742595546**
- **ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය** :**+94719802822**
  **ක්ෂණික ඇමතුම් අංකය** :**1989**

සහය අවශ්‍ය පාර්ශවයන්ට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ හදිසි ප්‍රතිචාර ඒකකය හා සම්බන්ධ විය හැක.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ 01**
**2026 මාර්තු 05 වැනි දින**


Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 5
17அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk